# ලංසු ඉල්ලුම් පත්‍රය

## බලන්ගොඩ නගර සභාව

බලන්ගොඩ නගර සභාව සතු බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථානයේ පවත්වාගෙන යනු ලබන පොල්තීන්/ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ මධ්‍යස්ථානයේ කලමණාකාරීත්වය 2016.02.01 දින සිට 2016.12.31 දින දක්වා නගර සභා ආඥා පනතේ 36(ඊ) වගන්තිය හා 40 වන වගන්තිය අනුව පවත්වාගෙන යෑම සඳහා ලංසු ඉල්ලීම.

01. ලංසු පෝරම නිකුත් කල දිනය :--------------------------------------------

02. නිකුත් කරන ලද්දේ කාටද යන වග :--------------------------------------------

03. ලංසුකරුගේ ලියුම් ලැබෙන පිළිවෙල :-------------------------------------------

04. ආපසු ගෙවන ඇප තැන්පත් මුදල හා ලදුපත් අංකය :------------------------------------

05. ලංසු පෝරම ගාස්තු හා ලදුපත් අංකය :---------------------------------------

06. ලදුපත් නිකුත් කරන ලද නිලධාරීගේ නම, .තනතුරු:---------------------------------------

07. ලංසුකරුගේ හැඳුනුම්පත් අංකය :--------------------------------------

08. ලංසුකරුගේ අත්සන :--------------------------------------

දිනය :-

------------------------

ලේකම්

බලන්ගොඩ නගර සභාව

# ලංසු ඉල්ලුම් පත්‍රය

## බළන්ගොඩ නගර සභාව

බළන්ගොඩ නගර සභාව සතු බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති පොල්තීන් /ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ කළමනාකාරීත්වය පවත්වාගෙන යෑම සඳහා වූ ලංසුව

| වැඩ විස්තර | මුදල |
| --- | --- |
| 01.බළන්ගොඩ නගර සභාව විසින් බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට අනුබද්ධව පවත්වාගෙන යනු ලබන පොලිතීන්/ප්ලාස්ටික් අපද්‍රව්‍ය එකතු කිරීම.වෙන් කිරීම,පිරිසිදු කිරීම,කැබලි කිරීම,හා ප්‍රත්චක්ක්‍රීයකරණය කිරීමේ සේවාව පවත්වාගෙන යෑම වෙනුවෙන් නගර සභාව ගෙවිය යුතු කුලිය මාසිකව | |

ඉහත වැඩ විස්තරයේ දැක්වෙන සේවාව 2016.02.01 දින සිට 2016.12.31 දින දක්වා මනා කළමනාකාරීත්වයෙන් පවත්වාගෙන යාම සඳහා දැනට ඉදිකර ඇති ගොඩනැගිල්ලේ මාසික කුලිය ---------------(ඉලක්කමෙන්---------------------) බළන්ගොඩ නගර සභාව වෙත මාසිකව ගෙවීමට -----------------------------------------------------ලිපිනයේ පදිංචි ---------------------වන මම මෙයින් පොරොන්දු වෙමි.එසේම ඊට අමතරව නගර සභාවෙන් ලබා දෙනු ලබන අපිරිසිදු පොලිතීන් මා විසින් භාර ගෙන සේදීමෙන් පසු බර කිරා කිලෝග්‍රෑම් එකක් සඳහා රුපියල් -------------------(ඉලක්කමෙන්----------------) ගෙවීමටත් අපිරිසිදු ප්ලාස්ටික් කිලෝග්‍රෑම් එකක් සඳහා පිරිසිදු කිරීමෙන් පසු රුපියල් ----------------(ඉලක්කමෙන්--------------------) ගෙවීමටත් වැඩිදුරටත් පොරොන්දු වෙමි.

එසේම ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරිය වූ නගර සභා ආඥා පනතේ 36 (ඊ) වගන්තිය ප්‍රකාරව එළැඹෙන ගිවිසුමකට මෙන්ම ඉහත කී කළමනාකාරීත්වය භාර ගෙන කටයුතු කිරීමට එකඟ වන අතර ඒ සඳහා එකඟ විය යුතු කරුණු එකින් එක මෙකී ගිවිසුමට ඇතුළත් කර ඇති ආකාරයෙන්ම පිළිගැනීමට එකඟ වන බැවින්ද ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කිරීමකදී සුදුසු පරිදි ගිවිසුමට ඇතුලත් කර ඇති බේරුම්කරුවකු මගින් නිශ්චය කර එම තීරණයටද එකඟ වෙමින් යම් කිසි අලාභයක් , පාඩුවක් සිදු වී ඇති විට ඉහත කී පනතේ 211,212 වගන්ති ප්‍රකාරව අධිකරණ ක්‍රියාමාර්ගයක් ගත හැකි බවද දන්නා අතර,බළන්ගොඩ නගර සභාව විසින් පනවා ඇති නීති රීති වලට හා අතුරු ව්‍යවස්ථාවලට එකඟව කටයුතු කිරීමටත් පාරිසරික සෞඛ්‍ය රැක ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් පනවා ඇති හා මතුවට පනවනු ලබන අණ පනත් , රෙගුලාසි අනුව කටයුතු කරන බවට මෙයින් පොරොන්දු වෙමි

දිනය :- --------------------------

ලංසුකරුගේ අත්සන

**බළන්ගොඩ නගර සභාවේ බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කලමණාකරන මධ්‍යස්ථානයට අනුබද්ධ පොලිතීන් /ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ මධ්‍යස්ථානයේ කළමනාකාරීත්වය පැවරීමේ විස්තර හා කොන්දේසි**

01. නගර සභා ආඥා පනතේ 36(ඊ) වගන්තිය අනුව ලංසු අවලංගු කිරීමට යටත්ව මෙම සේවාව බදු දෙනු ලැබේ.

02. ලංසු පිටපත් 02 කින් යුක්ත විය යුතුය.මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන් වශයෙන් ලියුම් කවර 02 ක බහා ලාකඩ මුද්‍රා තබා එම එක් එක් ලියුම් කවරයේ දකුණු කෙලවර මුදුනේ අදාල පරිදි මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සදහන් කර නැවත එම ලියුම් කවර දෙක ලොක- ලියුම් කවරයක බහා එම ලියුම් කවරයේ වම්පස මුදුනේ "බළන්ගොඩ නගර සභාවේ පොලිතීන් /ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයේ කළමනාකාරීත්වය පවත්වාගෙන යෑම" යනුවෙන් සඳහන් කර ලාකඩ මුද්‍රා තබා ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් බළන්ගොඩ නගර සභවේ කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම කල යුතුය.

03. ලංසු වල වෙනස් කර හෝ මකා තිබෙන සියලූම තැන්වල ලංසුකරුගේ අත්සන යෙදිය යුතුය.

04. ලංසු ආකෘති පත්‍ර ආදිය ලබා ගැනීමෙන් පසුව නියමිත වේලාවට කලින් ලංසු ඉදිරිපත් කිරීමට අපොහොසත් වන එසේම මෙහි ඇති කොන්දේසි උල්ලංඝනය කර ඇති බව අනාවරණය වුවහොත් ඒ අයගේ ඇප ලංසු තැම්පත් මුදල් ආපසු නොගෙවා සභාව සතු කරනු ලැබේ.

05. යම්කිසි ලංසු කරුවකගේ ලංසු පිළිගතහොත් ඔහු විසින් ගිවිසුම් ඇප වශයෙන් රුපියල් දසදහසක් (10000.00)ලංසු විවෘත කර පැය 01 ක් ඇතුලත මුදලින් නගර සභා කාර්යාලයේ තැන්පත් කල යුතුය.එසේ කිරීමට අපොහොසත් වන ලංසු කරුගේ ලංසු අවලංගු කර තැම්පත් කර ඇති ටෙන්ඩර් ඇප මුදල් සභාව සතු කරනු ලැබේ.

තම ලංසු පිලිගතහොත් ඉහත කී ඇප මුදල් තැන්පත් කිරීමට සූදානම් වී ලංසුකරු හෝ ඔහුගේ නියෝජිතයකු අනිවාර්‍යයෙන් පැමිණ සිටිය යුතුය.

07. පිළිගත් ලංසුකරු විසින් ලංසු පිළිගෙන දින 14 ක් ඇතුලත සභාව සමඟ ගිවිසුමකට එලැඹිය යුතු අතර එසේ ගිවිසුමකට එලඹීමට අපොහොසත් වන ලංසු කරුගේ ලංසු ඇප අවලංගු කර එතෙක් තැම්පත් කර ඇති සියළු ඇප සභාව සතු කරනු ලැබේ.

08. පිළිගත් ලංසුකරු අදාල කළමනාකරණ කටයුතු (මෙම දින දෙකද ඇතුලත්ව) 2016.02.01 (පෙබරවාරි පලමු දින) සිට ආරම්භ කර අඛන්ඩව 2016.12.31 දක්වා කරගෙන යා යුතුය.

09. පිළිගත් ලංසුකරු පොලිතීන්/ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයේ කලමනාකාරීත්වය භාර ගැනීමට පෙර නගර සභාවේ ලේකම් / මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් විධිමත් පරිදි භාර දෙනු ලබන භාන්ඩ ඉන්වෙන්ට්‍රි ලේඛනයක් භාර ගත යුතු අතර, එහි ඇති සියළුම උපකරණ ආරක්ෂා කිරීම ලංසුකරුගේ වගකීම වේ.නැවත ගිවිසුම අවසන් වීමේදී මෙම භාණ්ඩ නිවරදිව භාර දිය යුතු අතර යම් අලාභයක් සිදු වී ඇත්නම් තැම්පත් මුදලින් අඩු කිරීම හෝ සභාව නියම කරන ආකාරයෙන් එම අලාභය සභාවට ගෙවිය යුතුය.

10. පිළිගත් ලංසුකරු විසින් නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කලමනාකරණ මධ්‍යස්ථානයෙන් දෙනු ලබන සියළුම පොලිතීන්/ප්ලාස්ටික් මෙම ස්ථානයට භාර ගත යුතු අතර ඒවා සෝදා බර කිරීමෙන් පසු

කිලෝග්‍රෑම් 01 කට රු..............................බැගින් හා ප්ලාස්ටික් කිලෝග්‍රෑම් 01 කට රු..............................බැගින් මුදල් සෑම මාසයක්ම අවසන් වී දින 14 ක් තුල නගර සභාව වෙත ගෙවිය යුතුය.

11. ඊට අමතරව පාසල් මගින් එකතු කරනු ලබන 3Rසමාජයෙන් එකතු කරනු ලබන හා වෙනත් ආයතන වලින් ගෙන එනු ලබන පිරිසිදු පොලිතීන් වෙළඳපොලේ මිල ගණන් අනුව ලබා ගත යුතු අතර ඒවායේ  මිළ මෙම ස්ථානයේ ප්‍රදර්ශනය කල යුතුය.

12. මෙම ස්ථානයට සපයනු ලබන විදුලිය සඳහා විදුලි බිල ලංසුකරු විසින් මාසිකව ගෙවිය යුතුය.විදුලි බිලෙහි හිඟ නොතැබිය යුතු අතර ගිවිසුම අවසන් කිරීමට පෙර විදුලි බිල සම්පූර්ණයෙන්ම ගෙවා තිබිය යුතුය.මෙම ස්ථානය භාර ගැනීමට පෙර විදුලි මීටරය ලකුණු කර භාර ගත යුතුය.

13.  සෝදා පිරිසිදු කරනු ලබන පොලිතීන්/ ප්ලාස්ක් ප්‍රමාණ ලකුණු කිරීමට ලේඛනයක් පවත්වාගත යුතු අතර එම ලේඛනය දිනපතා ම.සෞ.ප මගින් සහතික කර ගත යතුය.

14. මෙම මධ්‍යස්ථානය පවත්වාගෙන යෑමේ දී හැකි තරම් පරිසරයට එකතු වන පොලිතීන් /ප්ලාස්ටික් එකතු කර ගැනීමේ වැඩපිළිවෙල සකස් කිරීමේ දී ලංසුකරුගේ සහයෝගය නගර සභාවට ලබා දිය යුතුය.

15. මෙම සේවාව සැපයීමේදී දෙපාර්ශවය අතර යම් ගැටුමක් පැන නැගුනහොත් එය විසඳීමේදී බේරුම්කරු ලෙස පළාත් පාලන කොමසාරිස් - සබරගමුව නම් කරන අතර ඔහුගේ නිගමනය පිලිගැනීමට දෙපාර්ශවයම බැඳී සිටී.

16. පිලිගත ලංසුකරු විසින් මෙම ස්ථානයේ අධීක්ෂණය කිරීම සඳහා නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක ,ලේකම් යන නිලධාරීන්ට බලය පැවරෙන අතර, එකී අධීක්ෂණ නිලධාරීන් විසින් ලංසුකරුගේ කලමනාකරණ කටයුතු පිළිබඳව අධීක්ෂණ වාර්තා සැපයීමට කටයුතු කළයුතු අතර, එසේ සපයනු ලබන වාර්තා සැලකිල්ලට ගෙන අවශ්‍යම ඕනෑම අවස්ථාවක ඒ පිළිබඳ විමර්ෂණය කිරීමෙන් පසු ලංසුව අවලංගු කළ හැකි බව දැන ගත යුතුය.

17. මෙම ස්ථානයේ ආරක්ෂාව ලංසුකරුට පැවරෙන අතර සේවකයන් හා කාර්‍ය මණ්ඩලය හැර පිටස්තර පුද්ගලයන් රදවා ගැනීම හො සම්පත් අනිසි ලෙස පරිභෝජනය කිරීම සපුරා තහනම් වේ.

18. මෙම ස්ථානයේ කලමනාකරණ සිදු කිරීමේ දී මහජනතාවට හිරිහැරයක් ,කරදරයක් , පීඩාවක් නොවන පරිදි කටයුතු කළ යුතු අතර, මෙම ස්ථානයේ විනීතව හා නීතිගරුකව කටයුතු කිරීමට ලංසුකරු හා ඔහුගේ නියෝජිතයන් වගබලා ගත යුතුය.

19. රටේ පවතින ආරක්ෂක තත්වයට අනුව දේපල හා මහජනතාවගේ ජීවිත වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අනන්‍යතාවය තහවුරු කළ හැකි විශ්වාසවන්ත සේවකයින් සේවයෙහි යෙදවීමට පිළිගත් ලංසුකරු වගබලා ගත යුතුය.

20. ලංසුකරු විසින් සේවයෙහි යොදවනු ලබන කම්කරුවන්ගේ සේවකයන්ගේ පහසුකම් හා ආරක්ෂාව , දීමනා වරප්‍රසාද සම්බන්ධයෙන් කිසිවිටෙකත් නගර සභාව විසින් වගකියනු නොලැබේ.

21. පිලිගත් ලංසුකරු විසින් සේවය සැපයීමට ගිවිසගෙන ඇති සේවා කාලය නිමවීමට පෙරාතුව තම සේවය අවසන් කිරීමට ලංසුකරු අපේක්ෂා කරන්නේ නම් නගර සභාවට එක් ලිත් මාසයක් කල් දීමෙන් පසුව ඔහුට එසේ කල හැකිය.

22. පිලිගත් ලංසුකරු විසින් ගිවිසගෙන ඇති පරිදි තම සේවා කටයුතු නිසි පරිදි ඉටු කරනු නොලැබුවහොත් හෝ සතුටු දායක ලෙස සේවය සැපයීම පැහැර හැරිය හොත් හෝ ඒ හේතුවෙන් ලංසුව අවලංගු කරන බවට ලංසුකරට ලිඛිතව දැනුම් දීමකින් අනතුරුව මෙම ලංසුව අවලංගු කිරීමට නගර සභාවේ සභාපතිට හෝ ලේකම්ට හෝ ඔහුගේ ඇවැමෙන් පත්වන වෙනත් අයකුට බලය තිබේ එවැනි අවස්ථාවක දී ලංසුකරු විසින් තැන්පත් කර ඇති ගිවිසුම් ඇපය ඔහුට ආපසු නොගෙවා සභාව සතු කරනු ලැබිය හැකිය.

23. මීට අමතරව මේ සම්බන්ධයෙන් බළන්ගොඩ නගර සභාවේ සභාපති හෝ ලේකම් විසින් පනවනු ලබන වෙනත් ඕනෑම කොන්දේසියකට පිළිගත් ලංසුකරු යටත් විය යුතුය.ලංසු පිළිබඳ අවසන් තීරණය නගර සභාවේ ගරු සභාපතිතුමා හෝ ලේකම් හෝ ප්‍රධාන ලංසු මණ්ඩලය හෝ සතුයි.

24. මෙම ගිවිසුමේ කිසියම් කොන්දේසියක් කඩ කරනු ලැබුවහොත් ඒ පිළිබඳව ගිවිසුම්කරුට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දී දින 07 කට පසුව ගිවිසුම අවලංගු කර ලංසුකරුගේ සේවය අවසන් කිරීමට සභාපති/ ලේකම්ට බලය ලැබෙන බව දැනගත යුතු අතර,එවැනි ක්‍රියාමාර්ගයක දී ඒ පිළිබඳව කිසිදු නීතිමය ආයතනයකට යෑමට ලංසුකරුට අයිතියක් නොමැති බව ද දැන ගත යුතුය.

25.පිළිගත් ලංසුකරු විසින් කවර හේතුවක් මත හෝ මෙම ලංසුව වෙනත් අයකුට නොපැවරිය යුතු අතර, අතුරු බදු දීමක් කළ නොහැකිය.

26. දේපල වලට යම් අලාභයක් වුවහොත් එම අලාභයේ තක්සේරු වටිනාකම හා 25%ක අධිභාරයක් ගෙවීමට දෙවන පාර්ශවය එකඟ වේ.

27. මෙම ස්ථානයේ සේවාව සපයනු ලබන අය සමඟ ගැටුමකට සේවය කරන අය නොයා යුතු අතර, යම් කිසි ප්‍රශ්නයක් ඇති වූ විට ඒ පිළිබඳව ලිඛිතව නගර සභාව වෙත දැන්විය යුතුය.

28. එවැනි අවස්ථාවක දී නගර සභාව විසින් ඒ සඳහා කමිටුවක් පත් කර අදාල පැමිණිල්ල විභාග කර තීරණයක් ලබා දෙන අතර, එම කමිටු තීරණයට ලංසුකරු එකඟ විය යුතුය.

-----------------------

ලංසුකරු